10

කිරම ධම්මානන්ද හිමියන් සහ උන්වහන්සේගෙන් සිදු වූ සාහිත්‍ය සේවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඉසංකා සංජීවනී, කේ.[1]

සිංහල සාහිත්‍යය විෂයෙහි ගෙන බලන විට දී විශේෂයෙන් ම රාජධානි පැවති ආකාරය අනුව සාහිත්‍ය යුග ද හඳුන්වා දීමක් සිදු විය. එනමුදු රාජධානි අනුව මාතර යුගය නමින් වෙන ම රාජධානි යුගයක් හඳුන්වා දී නොතිබුණ ද මාතර ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් ලියැවුණු සාහිත්‍යය, මාතර යුගයේ සාහිත්‍යය යනුවෙන් ඇතැම් විද්වත්හු පවසති. 18 වැනි ශතවර්ෂයේ අපර භාගයේ සිට 19 වැනි ශතවර්ෂයේ පූර්ව භාගය තෙක් ලක්දිව ධර්ම ශාස්ත්‍රීය ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානය මාතර නගරයයි. ඉහත කාල පරිච්ඡේදය තුළ ලංකාවේ ලියැවුණු පොතපත අතුරින් ඉතා වැඩි කොටසක් පද්‍ය සාහිත්‍ය කෘතීන් ය. ඉන් බොහෝමයක් රචනා කෙරුණේ මාතර ප්‍රදේශයෙහි උපන්නා වූ ගිහි පැවිදි උගතුන් විසිනි. සිටිනාමළුවේ ධම්මජෝති, කරතොට ධම්මාරාම, බෝවල ධම්මානන්ද, අකුරැස්සේ සුවණ්ණජෝති, ගල් ඇටඹේ පියදස්සි, සාලිඇලේ මණිරතන, මිහිරිපැන්නේ හිමි ආදි පැවිදි පිරිස ද පත්තායමේ ලේකම්, කටුවානේ දිසානායක මුදලි, තෝමස් මුහන්දිරම්, ගජමන් නෝනා, හරණ ගණිතාචාර්ය ආදි ගිහි පිරිස ද මාතර ශාස්ත්‍ර ප්‍රදීපය ඒකාලෝක කළ ද ඒ අතුරින් ද මහගු සාහිත්‍ය සේවයක් කළ පැවිදි ලේඛකයකු ලෙස කිරම ධම්මානන්ද හිමියන් හැඳින්විය හැකි ය. එනමුදු උන්වහන්සේගේ ශාස්ත්‍රීය සේවාව පිළිබඳ පුළුල් පර්යේෂණයක් මෙතෙක් සිදු වී නොමැත. එම නිසා උන්වහස්සේ විසින් රචිත සාහිත්‍ය කෘති සියල්ල අධ්‍යයනය කිරීම මාගේ අරමුණයි. ඒ සඳහා මාතර ප්‍රදේශයේ ධම්මානන්ද හිමියන් වැඩසිටි විහාරස්ථානවලට ගොස් එහි ස්වාමීන් වහන්සේලා හමු වී සිදුකරන සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි මඟින් කරුණු එක්රැස් කිරීමත්, විහාරස්ථානවල පොත්ගුල්, පුස්තකාල පරිහරණයත් ඉතිහාසය, සාහිත්‍යය, ජනශ්‍රැතිය ආදි ක්ෂේත්‍ර අලළා ලියැවුණු කෘති අධ්‍යයනය කිරීමත්, අන්තර්ජාලය භාවිතය මඟින් දත්ත ගවේෂණය කිරීමත් අපේක්ෂා කරමි. මාතර යුගයේ විශිෂ්ටතම සාහිත්‍යධරයෙකු වූ කිරම ධම්මානන්ද හිමියන්ගෙන් සිදු වූ සාහිත්‍ය සේවයත්, පශ්චාත් කාලීන සාහිත්‍ය කෙරෙහි උන්වහන්සේගේ බලපෑමත් යන මාතෘකා ඔස්සේ කරුණු ගවේෂණය කිරීම මේ පර්යේෂණයේ මූලික අරමුණයි.

ප්‍රමුඛ පදඃ මාතර යුගය, පද්‍ය සාහිත්‍යය, කිරම ධම්මානන්ද හිමි, ශාස්ත්‍රීය සේවාව, ගිහි-පැවිදි

1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය. Isankakottage31@gmail.com